'ඕනැ එකෙක් පේල් වෙච්චදෙන්'...
-ප්‍රගීත් එක්නැලිගොඩගේ කථිකාවකි-

මෙවර අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් භාගයක්ම අසමත් වී ඇති බව හෙළිදරව් වී තිබේ. පසු ගිය අවුරුදු වල සිට ටිකෙන් ටික වර්ධනය වී උත්සන්න වූ ව්‍යසනයකි මේ. මුලින් මුලින් ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව ගණකාධිකරණය වැනි තාර්කික බුද්ධිය වඩ වඩාත් වුවමනා කැරෙන විෂයයන් හි දරුවන් සිය අසමත්භාවය පෙන් වූ අතර අධ්‍යාපන ප්‍රධානීන් ඊට විසැඳුම් සොයාගත්තේ ඒ ඒ විෂයයන් ට අයත් පාඨමාලා කප්පාදු කිරීමෙන් ය. හරියට සමහර ජෝං බාස්ලා තමන් නොදන්නා එන්ජින් අලුත්වැඩියා කරන්නනට ගොස් පැරදී, නැවත නියමිත පරිදි සවි කරන්නට නොදන ඉතිරිවන ඇණ මුරිච්චි වැඩකට නැති ඒවායැයි කියා අහකට විසි කරනවා මෙන්ය. නැතහොත් මුට්ටිය බේරා ගන්නට එළුවාගේ බෙල්ලකැපුවා මෙන්ය. අධ්‍යාපන මහදැන මුත්තන් ද ඔවුන්ගේ ගෝලයන් ද දුන් ඒ විසැඳුම් වලින් පසුවද ගණිතය සමත් වන්නේ සියයට හතරක් තරම්ය. කප්පාදු කළ අනෙක් විෂයයන් ගේ තත්ත්වයද එබඳුය. දැන් කොයි විෂයයත් සමත් වීමට දරුවන් අසමත්ය. සියයට හතරක්වත් සමත් වන්නේ නැති විෂයයන් විෂය මාලාවෙන් ඉවත් කළයුතු බවක් ද වරෙක විභාග කොමසාරිස්වරයා පැවසුව බවක් මතකය. අධ්‍යාපනයේ බිඳවැටීමට දුන් විසැඳුම් එබඳුය.ඒ අනුව ගණිතය ඉංග්‍රීසි භාෂාව වැනි විෂයයන් ඇත්තේ රතු ලැයිස්තුවේ බව පැහැදිලිය. එක එක දේශප්‍රේමී පණ්ඩිත කතා දොඩවමින් ද, බටහිර ලෝකයට දොස්නගමින් ද සිටියා මිස කොතැනක හෝ තමන් අනුයන ක්‍රමයේ මුල කුණු වී ඇති බවනම් කීයටවත් අපේ අධ්‍යාපන පණ්ඩිතයෝ වටහා නොගත්හ. තවම ත් ඒ ගැන වගේ වගක් නැත. අධ්‍යාපන ඇමැතිවරයාට ද ඒ ගැන හාංකවිසියක්වත් නැති ගානය. බාග වෙලාවට ආණ්ඩුවේ අනෙක් ලොක්කන් මෙන්ම පළමුව මවුබිම දෙවනුව පාසල කියා අධ්‍යාපන ඇමති වරයාත් කල්පනා කරනවා වන්නට බැරි නැත. එහෙමත් නැත්නම් මේ රණශූරයන්ගේ යුගය බැවින් සාමාන්‍ය පංතියේ දරුවන් විභාග වලින් අසමත් වීම කාලයට ගැලපෙන වාසනාවක් යැයි කියා සිතුවා වන්නටත් බැරි නැත. කොයි හැටි වෙතත්, මේ අධ්‍යාපන පරිහානියෙන් අනෙක් ජන සමූහ වැනසීම කොතෙක් දුරට සාර්ථක වී ඇත්දැයි නොදනිතත්, දේශප්‍රේමීන් විසින් දිවි දී රැක ගන්නවායැයි කියන සිංහල ජාතියේ ඇණ මුරිච්චි ටික නම් මේ වනවිට හැලී ඇති බව පැහැදිලිය. කොයිහැටි වෙතත් 2500

ඉතිහාසයක බර කරේ තබාගෙන සිටින වීර සිංහළ ජාතිය මිහි තලයේ අසරණයන් බවට පත් වෙමින් සිටී.

මේ විදියට අසමත් වූ ශිෂ්‍යයන් කවුද? ඔවුන් අසමත් වූයේ ඇයි? ඔවුන්ගේ අනාගතය මෙන්ම රටේ අනාගතයට එ මගින් සිදුවිය හැකි අනර්ථය කුමක්ද? ලෝකය ඉදිරියේ අප අසරණ වෙයිද? ආදී ප්‍රශ්න ශිෂ්ට සම්පන්න රටක වග කිවයුතු බුද්ධිමත් අධ්‍යාපන ඇමැතිවරයෙකුටනම් බැරෑරුම් ප්‍රශ්න වනවාට සැකයක් නැත. ශිෂ්ට සම්පන්න රටක වගකිවයුතු කැබිනට් මණ්ඩලයකට හෝ රටේ නායකයාට ද එය බරපතල ප්‍රශ්නයක් වනවාට සැකයක් නැත. එ හෙත් පුදුමය නම් ලෝකෙන්ම උතුම් ලංකාවේ දේශප්‍රේමී ආණ්ඩුවට ඒ ගැන කිසි ගානක් නැති වීමය. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන්නට වැර දරනා රටක, අධ්‍යාපනය ද හේතුවක් කරගත් ගැඹුරු සමාජ ගැටුමක් ද ඇවිලී ඇති රටක, අධ්‍යාපනය යනු වැදගත්ම විෂය ක්ෂේත්‍රයකි. ඒ නැතත් මේ යුගය වූ කලී, ලෝකයේ මිනිස් දැනුම හා ප්‍රඥාව ප්‍රමුඛ කොටගත් සංවර්ධනය සිදුවන, අලුත් ශිෂ්ටාචාරයේ යුගයයි. දැනුම ප්‍රාග් ධනය ලෙස සලකන යුගයයි. එවන් යුගයක මෙවන් රටක අධ්‍යාපනයේ බිඳ වැටීමක් සිදුවන්නට ඉඩහැර, ඒ රටේ බාල පරපුර වලපල්ලට ගියාවේ කියා බලා සිටිය හැක්කේ පාපිශ්ට පාලකයෙකුටම පමනි. දේශප්‍රේමයම උදේ හවා ජප කරන උදවිය ඒ ගැන ගැඹුරින් සිතිය යුතුය. මන්ද කියනවානම් ජන සමාජයකටම ඉතිහාසයේ හිමි වටිනා අවස්ථා අහිමි කිරීම ඒ ජන සමාජයට කරන ද්‍රෝහී කමක් බැවිනි. එ හෙත් ඒ අය නිහඬය. උදේ ඉඳන් රෑ වන තෙක් ම ඔවුන් මහජනයා මුලා කිරීමට ජප කරනා දේශප්‍රේමී මංත්‍රයේ යථා තත්ත්වය එසේය. යුද්ධය ඉවර වන දිනක් තිබුනෝතින් එදාට ආණ්ඩුවත් කැබිනට් මණ්ඩලයත් ඔවුන්ගේ පවුල් ටිකත් රැකී සිටියොත් මදි ද?

සියවසකටත් වැඩි කාලයක් තිස්සේ අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ දේශපාලනඥයන්ගේ වැදගත් පොර පිටියකි. 1956 දී බණ්ඩාරනායක මහතා බලයට පත් වීමට යොදාගත් පංච මහා බලවේග නමින් හැඳින් වූ සමාජ ශ්‍රේණි වලින් ප්‍රධාන හා වැදගත් බලවේගයක් වූයේ ගුරුවරුන්ය. නැතහොත් ගුරු බලවේගයයි. එදා දේශපාලන මායා ගුලිය අනුභව කොට, පාර්ලිමේන්තු පක්ෂ දේශපාලනය හා මිශ්‍ර වූ ඒ ගුරු බලවේගයෙන් අකුරු කළ සිසුන්, ඊට දශක එක හමාරක් ගතවන්නටත් කලින් දේශපාලන බලය සඳහා සන්නද්ධ කැරලි ආරම්භ කළ බව මෙහිලා සඳහන් කළ යුතුය.

එ මෙන්ම ගුරුබලවේගයේ දෙවන, තෙවන ආදී වශයෙන් වූ ඊළඟ පරම්පරා පරිපූර්ණ වශයෙන්ම ගුරුවරුන් වනවාට වඩා වෙනස්ව රටේ ඒ ඒ පක්ෂ වලට අයත් දේශපාලන ක්‍රියාධරයන් හැටියට සිතාගෙන ක්‍රියා කරන්නට වූ බවත් කිවයුතුය. අධ්‍යාපන පරිහානියේ දෙවන අවදිය එයය. ඒ ඒ දේශපාලන පක්ෂ තම තමන්ගේ දේශපාලන මතය ව්‍යාප්ත කර ගැනීමටත්, බලය පතුරුවා ගැනීමටත් අධ්‍යාපනය යොදාගත්තේ එම පරිහානියේ තවත් අදියරක් වෙත ගමන් කරමින්ය. මේ නිසා අධ්‍යාපනය හා රටේ එදිනෙදා දේශපාලනය ළඟින්ම එකට ඈඳිනි. ළමයෙකුට අධ්‍යාපනය ලබාදීම නම් අතිශය සංවේදී බැරෑරුම් විද්‍යාව තුට්ටුවකටවත් නොසලකා, අධ්‍යාපන විද්‍යාඥයන් විසින් කළ යුතු ගුරුපත්වීම් ලබාදීම තම අතට ගෙන, නිසි ප්‍රමිතියක් ඇතත් නැතත් තමන් ගේ දේශපාලන හිතවතුන්ට කරන සැලකීමක් ලෙස ගුරුපත්වීම් ලබා දීම දේශපාලනඥයන් කරන්නේ ඒ නිසාය. අධ්‍යාපන ආයතන රැකියා බැංකුවක් හැටියට පරිවර්තනය වූයේ එසේය. අධ්‍යාපනය පිරිහීමේ එක් මූල හේතුවක් වන්නේ එය නොවේද? එය බාල පරපුරේ දෑස් අන්ධ කිරීමක් නොවන්නේ කෙසේද? මේ රටේ ආණ්ඩු දශක හතර පහක් තිස්සේ කළේ ඒ ජාතික අපරාධය නොවේද? ගුරු වෘත්තියටත් අධ්‍යාපන නිලතලවලටත් දිසාපාමොක්වරුන් වෙනුවට වන්දිභට්ටයන් පත් කිරීමෙන් මේ විදියට අධ්‍යාපනය වලපල්ලට නොගියා නම් එය පුදුමයක් නොවේද?

ලෝක මට්ටමින් සලකා බලන විට ලංකාවේ ගුරුවරුන් ගේ ප්‍රමිතිය එන්න එන්නම පල්ලම් බහිමින් තිබේ. ඔවුන්ගේ දැනුම යාවත්කාලීන වන්නේ නැත. ඒ ගුරුන්ගෙන් අකුරු කරනා සිසුන්ගේ ප්‍රමිතියද ඒ හා සමානව පල්ලම් බහිමින් තිබේ. ශ්‍රී ලාංකීය තරුණ උගතාගේ පෞරුෂය ඒ අනුව බිඳවැටී තිබේ. මේ වන විට ලෝකයේ හෝ රට තුළ වැදගත් නවීන රැකියාවක් කිරීමටවත් තනතුරක් දැරීමටවත් මේ රටේ උසස් අධ්‍යාපනය සම්පූරණ කළ තරුණ දරුවන් අසමත් වන්නේ ඒ නිසාය.

පොදුවේ කොයියම්ම සමාජයක දී මෙන්ම, විශේෂයෙන්ම ශ්‍රී ලංකාව වැනි ජීවන ප්‍රගතියේ පරිපථ දුලබ සමාජයකදී අධ්‍යාපනය යනු අතිශය වැදගත් කමක් දරන ක්ෂේත්‍රයකි.(ජීවන ප්‍රගතියේ පරිපථ යනුයෙන් අදහස් කරන්නේ පුද්ගලයෙකුට සමාජයේ ඉහලට නැග ගන්නට හෙවත් දියුණු වන්නට තිබෙන මාර්ගයන්ය.) රටේ ඒ ඒ ජන වර්ග අතර තියුණු තරගයක්

අධ්‍යාපනය තුළ ඇති වූයේත් එය වත්මන් වාර්ගික සිවිල් යුද්ධයේ මූල ධාතුවක් වූයේත් ඒ ජීවන ප්‍රගතිමාර්ග වල හිඟයයි. බලය නැති කුඩා ජන වර්ග අධ්‍යාපන පිටියෙන් එලවා දැමීමට බලය ඇති ප්‍රධාන ජන වර්ගය ක්‍රියා කිරීමත්, ආණ්ඩු බලය ලබා ගැනීමේ ප්‍රධාන දේශපාලන සාධකයක් බවට අධ්‍යාපනය පත් වීමත්, තේරුම් ගත හැක්කේ ඒ සංදර්භය තුළයි. අධ්‍යාපනයේ වත්මන් බිඳවැටීමේ මූලයන් පිහිටා ඇත්තේ අධ්‍යාපනයට දේශපාලනය ආවේශ වූ ඒ යුගයෙහිය.

1880 දී ආණ්ඩුවට අයත් පාසල් 400 ක් හා ඒවායේ උගෙනුම ලැබූ සිසුහු 24.000 දෙනෙක් වූහ. ඒ අතර මිෂනාරි පාසල් 840ක් ද ඒවායේ උගෙනුම ලැබූ සිසුහු 61.000 දෙනෙක් ද වූහ. 1899 වනවිට ආණ්ඩුවේ පාසල් 490 දක්වා ද මිෂනාරි පාසල් 1000 ක් දක්වාද වර්ධනයක් අත්පත් කරගෙන තිබුණි. ඒ වායේ ඉගෙනුම ලබන සිසුන් ගේ ගණන 150.000 ද ඉක්මවා තිබිණි. මෙම පාසල් 1490 ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබාදුන් පාසල් විය. (මෙම ඉංග්‍රීසි භාෂා සම්පත දිගටම රැකගත්තේ නම් එය විදේශ විනිමය උපයන මහා උල්පත වන්නට ඉඩ තිබිණි. ලංකාව ආසියාවේ අධ්‍යාපන කේන්ද්‍රය බවට පත් කරගන්නට පිළිවන්කම තිබිණ.) 1940 වනවිට මෙම ගණන බොහෝ ඉහලට නැග තිබිණ. මිෂනාරි පාසල් වලට සමාන්තරව බෞද්ධ හා හින්දු පාසල් පද්ධතියක් ද බිහි වී තිබීම ඊට හේතු විය. ඊනියා දේශප්‍රේමී දේශපාලන උමතුව ඉහට ගැහීම නිසාත්, බෞද්ධ - මිෂනාරි බේදය වාසියට ගෙන බෞද්ධයා රවටාගෙන වැඩි ඡන්ද බලයක් උපයාගත හැකි බව පෙනීගිය නිසාත්, ලංකාවේ වසල නායකයන් කළේ ආණ්ඩුවේ පාසල් ගණන වැඩිකරනවා වෙනුවට තමන් මහ ලොකු වැඩක් කළා කියා මෝඩ මහජනයාට පෙන්වීමට අර ස්වාධීනව ගොඩනැගුනු පෞද්ගලික පාසල් පද්ධතිය ආණ්ඩුවට උදුරා ගැනීමය. අතින් වියදමක් නැතිව සූර සරදියල් මෙන් කාගේ හෝ දෙයක් උදුරාගෙන ගැලරියට මැජික් පෙන්වීම ලංකාවේ දේශපාලන වසලයන්ගේ නොමැකෙන පුරුද්දකි. අනතුරුව සිංහළ පමණක් යැයි කියා ඉංග්‍රීසි මාධ්‍ය පාසල් වලට තිත තබා, සිංහළ ජාතිය අතර වීරයන් වන්නට ක්‍රියා කළේත් ඒ පුරුද්දට අනුව යමිනි. එතැන් සිට ඉංග්‍රීසි දැනුම ප්‍රභූ ආභරණයක් බවට පත් විය. 56 විප්ලවයේ ප්‍රතිපලයක් ලෙස උපන් ඉංග්‍රීසි නොදත් අසරණ සිංහළ තරුණයා බේරා ගන්නට අද 56 විප්ලවයේ වීරයන් නැත. අද ඔහු ඉංග්‍රීසි නොදත්, එනිසාම ලෝක දැනුම එන මාර්ගය වසාගත්, සිංහලත් නොදත්, දිනපතා වර්ධනය වන ලෝක ඥාණය ඇසුර නොමැති, පෞරුෂය සිඳගත්, මායා

අතීතයට යන්නට පාරවල් සොයන, සහතිකලත් මුග්ධයෙකු බවට පත් වී සිටී. අසල් වැසි රටවල් නැනෝ තාක්ෂණයේ මහත් ඵල නෙලද්දී ජේ.ආර්.පී සූරියප්පෙරුම වැනි 56 විප්ලවයේ දරුවන් ගේ වල් බන හා සම්ප්‍රප්පලාප අසා බිසෝ කොටුව හා ඇලවුනු ගල් කනු දෙස බලා සිට වල්මත්වීම හැර අන් යමක් ඔහුට ඉතිරිව නැත. මේ නම් අනුන්ට වල කපන්නට ගොස් තමන් ම වලේ වැටීමකි. 1948 දී බලය අතට ගත් සිංහල නායකත්වය සිය නායකත්වයේ ජාතික වගකීම හැටියට ගෙන ක්‍රියා කොට ඇත්තේ සංඛ්‍යාවෙන් කුඩා වාර්ගික, ආගමික හා සංස්කෘතික ජන සමූහ සමාජ ආර්ථික දේශපාලන පිටියෙන් පලවා හැරීමය. එසේ කිරීමට ඇටැවූ මරු වැල් වල අද සිංහලයාම පැටලී සිටීම ඓතිහාසික සරදමකි. 1948 සිට මේ දක්වාම අනෙකුත් ප්‍රති පත්ති මෙන්ම අධ්‍යාපන ප්‍රතිපත්ති ද නිෂ්පාදනය කළේ සිංහබාහුලා සහ සිංහ සිවලීලාමය. ඉතින් දැන් පැමින ඇති ව්‍යසනයෙහි වගකීම ඔවුන් බාරගත යුතුව ඇත. ඉතින් ඕවට මං මොනව කරන්නද කියා සුරතල් කතා කියන්නට අධ්‍යාපන ඇමති සුසිල් ප්‍රේමජයන්ත මහතාට කිසිදු අයිතියක් නැත. මන්ද? මේ එතුමාගේ පක්ෂයේ සමාජ දර්ශණයේ ප්‍රතිපලය. එතුමාගේ පුරෝගාමීන් අස්වැද්දූ කෙතෙහි අස්වැන්නය.

ආණ්ඩුවක් කළ යුත්තේ අධ්‍යාපන ප්‍රතිපත්ති සැදීම වුවත් මේ නායකයන් එදා කළේ ඊර්ෂ්‍යාව, ක්‍රෝධය හා වෛරය පෙරදූරි කරගෙන පාසල් ටික රජයට පවරා ගැනීමය. සිංහල දරුවාට සිදුව ඇති අසාධාරණය ඉවත් කිරීම එහි අරමුන යැයි එහි පසුබිමෙහි සිටි ගිහි පැවිදි උතුමෝ පැවසූහ. එහෙත් මතු පිටට නොපෙනුන සියුම් හේතුවක් ඊට පසුබිමින් තිබිනි. මිෂනාරි පාසල් මට්ටු කිරීමෙන් බෞද්ධ පාසල් හා ඒ පිටුපසින් වූ බලවේග සතුටු කිරීම ඉන් එකකි. සංඛ්‍යාවෙන් කුඩා ජනවර්ගවල හා ආගමික ජන සමූහවල ව්‍යාප්තිය අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පාලනය කිරීම තවත් එකකි. එහෙත් යකා දොඩම්ගොඩ බදා ගත්තා සේ පාසල් රජයට පවරා ගත් දා සිට නිදහස් අධ්‍යාපනය කෙසේ වෙතත් අධ්‍යාපන ඒකාධිකාරයක් බිහි වී එය ක්‍රම ක්‍රමයෙන් දූෂිත වී අධ්‍යාපනයේ නිදහස අහෝසි විය. දැන් එය ආපසු හැරවිය නොහැකි ශාපයක් ගණනට වර්ධනය වී තිබේ. ඒ කෙසේද යත්, අද වනවිට විභාග සමත් වීම කෙසේ වෙතත් ළමයෙකු බාලාංශ පන්තියට ඇතුලු කිරීම ද කරුමයක් වී තිබේ. රටේ ප්‍රධාන පාසල් ටික ආදි ශිෂ්‍ය ප්‍රභූ සමාජයේ හා බැරැක්ක සමාජයේ දරුවන්ට පළමුවද ඉඩක් තිබුනෝතින් සාමාන්‍ය පුරවැසියාගේ දරුවන්ට දෙවනුවද වෙන් වී තිබේ. මෙය කිවිඳු ගුණදාස අමරසේකර පවසා ඇති

හැටියට 56 විප්ලවයේ ඉතිරි කොටස රාජපක්ෂ මහතා සම්පූර්ණ කරන ආකාරය විය හැකිය.

පෞද්ගලික පාසල් පද්ධතිය විනාශ නො කළේනම් ඊනියා ජනප්‍රිය පාසල් පොරයක් ඉපැදී පාසල් පද්ධතිය අල්ලස් පොලක් වී දූෂිත වන්නේ නැත. ඒ උසස් ප්‍රමිතියේ පාසල් සුලබ වී තම තමන් ගේ සිතැඟියාවන්ට අනුව තෝරා ගැනීමේ නිදහස ලැබෙන විට පගාකාර විදුහල්පතිවරුන් පසුපස ගාටන්නට දෙමවුපියන් හට සිදු නොවන නිසාය. එ මෙන්ම අධ්‍යාපනයේ බරෙන් විශාල කොටසක් පෞද්ගලික පාසල්වලට දැරීමට හැකි බැවින් ආණ්ඩුව මත පැවරෙන බර සැහැල්ලු වී, ආණ්ඩුව ද අධ්‍යාපනය වෙනුවෙන් දරන පිරිවැයෙන් අදට වඩා ප්‍රශස්ථ සේවයක් පොදුජනයාට ලබා දීමට අවස්ථාවක් ලැබෙන්නට ඉඩ තිබිණ. සිංගප්පූරුවේ පෞද්ගලික විශ්වවිද්‍යාල, ඒවා ලබන ආදායමෙන් රාජ්‍ය විශ්වවිද්‍යාල නඩත්තු කැරෙන අතර, සිංගප්පූරු රාජ්‍ය විශ්වවිද්‍යාලය විශිෂ්ඨ ප්‍රමිතියකින් පවත්වාගෙන යන බව මෙහිදී සිහිපත් කළ යුතුය. යථාර්ථය එය වුවත් ඒ යථාර්ථයට ඉඩ දෙන්නට තරම් පුළුල් දැක්මක්, නුවණක් හෝ ශක්තියක් රට පාලනය කළ ජනතා පුත්‍රයන්ට නොතිබින. අදත් නැත. එවන් ප්‍රඥාවක් ඔවුන්හට වී නම්, සිංහළ බෞද්ධ නොවන ජන සමූහවල ඉදිරිගමන වලකාලන්නට අධ්‍යාපනය යොදාගන්නේ නැත.

අධ්‍යාපනයේ මේ නින්දාසහගත පිරිහීම ගැන සිතන කල, නිදහසින් පසු 60 වසරක් ගත වන විට, තම සිංහළ ජාතියටවත් තෘප්තිමත් ජීවිතයක් ලබාදීමට අසමත් වූ රාජ්‍යයකට හා එහි නායකයන්ට, කුඩා ජනවර්ගවල ඉරණම තීරණය කිරීමට ඇති යුක්ති සහගත අයිතිය කුමක්ද යන සාධාරණ ප්‍රශ්නය මතුවේ. තවත් ආත්ම භාවයක් ගැන කොයි මනුෂ්‍යයාතුළත් විශ්වාසයක් ඇතත්, මිනිසෙකුගේ මෙලොව පරම ආයුෂ පිරිහීයාමට මත්තෙන් ගෙයක් දොරක්, රැකියාවක්, සුදුසු විවාහයක්, තෘප්තිමත් ජීවිතයක් ගතකිරීමට අයිතියක් තිබිය යුතුය. එය සිංහල මනුෂ්‍යයාට මෙන්ම අනෙක් වාර්ගිකයන්ටද පොදුය. ඒවා ලබා ගැනීම ඊළඟ ආත්ම භවයට කල්දැමිය නොහැකිය. ඒ ප්‍රාථමික මානුෂික වුවමනාවන්වත් ඉටුකරන්නට අසමත් වූ ජාතියක් හා නායකත්වයක් තවදුරටත් තම නායකත්වයම පිළිගන්නට කියා සංඛ්‍යාවෙන් කුඩා ජාතීන්ට කියන්නේමන්ද? තම බිරිඳටත් දරුවන්ටත් කුසට අහරක් ලබා දෙන්නට අසමත් නිකමෙකු තවත් බිරින්දන් පතනවා වැනි අමනකමක් නොවේද එය?. මෙරට

සංඛ්‍යාවෙන් කුඩා ජනවර්ග සැබෑ දුක්ගැනවිල්ල කුමක්ද කියා ඉගෙන ගන්නවානම් ඉගෙන ගන්නට මෙවර අපොස සාපෙ විභාග ප්‍රතිඵලයම සෑහේ. මේ පාලකයන්ට අසන්නට කණ් ද දකින්නට ඇස් ද ලැබෙන තෙක් ශ්‍රී ලංකා ජනරජ වාසීන්ට සංතෘප්ත ජීවිතයක් ලබා දෙන්නට නම් කවදාවත්ම නොහැකිබව දූන් සක්සුදක් සේ පැහැදිලිය. ෆ්‍රිඩ්‍රිච් ෂිලර් නම් ජර්මානු කවියා ගේ අපූරු සාර සටහනකින් මෙම සටහන අවසන් කරමි.

මිනිසාගේ මනා අරමුණු ඉටු කිරීමට බැරි රාජ්‍යයක් කුමටද? ඒ මහා අරමුණු නම් මානව වර්ගයා ශිෂ්ට සම්පන්න කිරීමේ බලයයි. කිසියම් රාජ්‍යයක් මිනිසා තුළ ඇති හැකියාවන්, කුසලතාවන් හා සිතුවිලි පාලනය කිරීමට අත්තනෝමතික ලෙස මැදිහත් වෙයි නම්, ඒ රාජ්‍ය මොනතරම් අපූරුවට පිළියෙළ කොට ගෙන තිබුනත් එය තඹයක්වත් වටින්නේ නැත. එය නීච රාජ්‍යයකි. ව්‍යසනයකි. එය ජාතියක අභිමානය නොව ජාතියේ අපකීර්තියයි. ලජ්ජාවටත් නින්දාවටත් හේතුවයි. එය දිගු කාලීන භීෂණයේ උල්පතයි. එබඳු රාජ්‍යයක් යම් කාලයක් පවතීද, එතුවක් කල් ම ව්‍යසනයද පවතී.

( උපුටාගැනීම ලිකර්ගස් හා සොලොන්ගේ නීති පොත නම් කෘතියෙනි)

-ප්‍රගීත් එක්නැලිගොඩ විසිනි-